# කොළඹ විශ්වවිද්‍යාලයීය
# සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය ඩිප්ලෝමා පාඨමාලාවට
# අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 31 වැනිදා

කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය අංශය මෙහෙයවන සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාවේ 2020 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය බොහෝ දෙනාගේ ඉල්ලීම පරිදි  දෙසැම්බර් 31 වැනිදා දක්වා දීර්ඝ කළ බවත් එම දිනය අයදුම්පත් භාරගන්නා අවසාන දිනය ලෙස සැලකිය යුතු බවත් පාඨමාලා සම්බන්ධීකාරක මහාචාර්ය සමන්ත හේරත් මහතා දන්වා සිටී. වෘත්තීය පාඨමාලාවක් වශයෙන් ජාතික වෘත්තීය සුදුසුකම් ස්තරයෙහි පස්වන කාණ්ඩයට (NVQ Level 05) අයත් 'සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය' ඩිප්ලෝමා පාඨමාලාව ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ තෙවන ස්තරයට (SLQF Level 03) අයත් පාඨමාලාවක් වශයෙන් උසස් කර ඇත. ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ රැකියාවල නියුක්ත හා අදාළ සේවා පළපුරුද්ද ඇති මාධ්‍යවේදීන්ට මේ සඳහා අයදුම් කළ හැකි ය. මීට අමතරව, නිදහස් මාධ්‍යවේදීහු ද දැනට ලේඛන කටයුතුවල නියුක්ත සාහිත්‍යවේදීහු ද ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නිර්මාණ ශිල්පීහු ද මෙම පාඨමාලාවට අයදුම් කිරීමට සුදුසුකම් ලබති.  එමෙන්ම, ජනමාධ්‍ය ක්ෂේත්‍රයට පිවිසීමට අපේක්ෂා කරන, දැනට ජනමාධ්‍ය ක්‍රියාකාරකම්වල නියුක්ත ප්‍රමාණවත් සුදුසුකම් සහිත ආධුනිකයන් සීමිත සංඛ්‍යාවක් ද පාඨමාලාවට ඇතුළත් කරගැනෙන බැවින් ඔවුන්ට ද සිය අයදුම්පත් යොමු කළ හැකි ය.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන් ම මෙම පාඨමාලාව පැවත්වෙන අතර සිසුන් බඳවා ගැනෙන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි. මේ පිළිබඳව වැඩි විස්තර www.cmb.ac.lk වෙබ් අඩවියෙන් හා ජනමාධ්‍ය අංශයේ දුරකථන අංක 011-2500431 ඇමතීමෙන් ලබාගත හැකි ය.